# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2292/35 - 2022 අගෝස්තු මස 09 වැනි අඟහරුවාදා - 2022.08.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2020 අංක 01 දරන ශ්‍රී ලංකා පරිසර වෘත්තීයවේදීන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත**

(7 වගන්තිය යටතේ නියෝගය)

2020 අංක 1 දරන ශ්‍රී ලංකා පරිසර වෘත්තීයවේදීන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනතේ 7 වැනි වගන්තිය යටතේ ශ්‍රී ලංකා පරිසර වෘත්තීයවේදීන්ගේ ආයතනයේ සභාව විසින් සකස් කරන ලද ශ්‍රී ලංකා පාරිසරික වෘත්තිකයන්ගේ ආයතනයේ රීති.

මහාචාර්ය නිරංජනී රත්නායක,
සභාපති,
ශ්‍රී ලංකා පරිසර වෘත්තීයවේදීන්ගේ ආයතනය.

2022 අගෝස්තු මස 12 වැනි දින,
කොළඹ දී ය.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය**

***ශ්‍රී ලංකා පරිසර වෘත්තීයවේදීන්ගේ ආයතනයේ රීති***

2020 අංක 1 දරන ශ්‍රී ලංකා පරිසර වෘත්තීයවේදීන්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනතේ 7 (1) වන වගන්තිය යටතේ සාදන ලදී.

2021 දෙසැම්බර් මස 20 වැනි දිනැති අංක 2259/7 දරන රජයේ *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කර ඇති ඉහත උපලේඛනය මෙයින් පහත පරිදි සංශෝධනය කෙරේ.

**(1) 4.7 (උෟ) ඡේදය අවලංගු කිරීම සහ පහත සඳහන් දේ ආදේශ කිරීම මගින්;**

(උෟ) වාර්ෂික ගිණුම් ප්‍රකාශය පිළියෙළ කර එය වාර්ෂික මහා සභා රැස්වීමේදී (AGM) ඉදිරිපත් කිරීම සඳහා වරලත් ගණකාධිකාරිවරයකු විසින් සහතික කර ගත යුතු අතර, කිසියම් සාමාජිකයකු විසින් කිසියම් විමසීමක් කළහොත්, භාණ්ඩාගාරික විසින් මහා සභා රැස්වීමේදී එවැනි විමසීමකට ප්‍රතිචාර දැක්විය යුතුය.

**(2) හි 12 වන ඡේදයට පහත සඳහන් නව කොටස් එක් කිරීමෙන්;**

12.11 ශ්‍රී ලංකා පරිසර වෘත්තීයවේදීන්ගේ ආයතන (IEPSL) හි සාමාජිකත්වය දේශීය වෘත්තිකයන් සඳහා වන සුදුසුකම් නිර්ණායක යෙදීමෙන් සහ අදාළ සාමාජිකත්වය සඳහා දේශීය සාමාජික ගාස්තුවට අමතරව වසරකට ඇමරිකානු ඩොලර් 100 ක සාමාජික ගාස්තුවක් අය කිරීමෙන් විදේශීය පුරවැසියන්ට ද ලබා දිය හැකිය. කවුන්සිලයේ අනුමැතියට යටත්ව සාමාජික ගාස්තු කලින් කලට සංශෝධනය විය හැක.

12.12 ශ්‍රී ලංකා පරිසර වෘත්තීයවේදීන්ගේ ආයතනය (IEPSL) ශ්‍රී ලංකා මහ බැංකුවෙන් උපදෙස් ලබා ගැනීමෙන් පසු ඉහත සඳහන් දෑ සඳහා සහ ආයතනයේ අරමුණුවලට අදාළ වෙනත් ඕනෑම කටයුත්තක් සඳහා අරමුදල් ලබා ගැනීම සඳහා සුදුසු විදේශ මුදල් ගිණුමක් විවෘත කළ හැකිය.

**(3) ඇමුණුම බී 1 හි 1.2 වැනි ඡේදය අවලංගු කිරීම සහ පහත සඳහන් දේ ආදේශ කිරීම මගින්;**

(අ) ජීව විද්‍යාව, භෞතික විද්‍යාව, භූගෝල විද්‍යාව, කෘෂිකර්මාන්තය, ඉංජිනේරු විද්‍යාව, ගොඩනගන ලද පරිසරය, පරිසර කළමනාකරණය හෝ වෙනත් අදාළ විෂයයන් පිළිබඳ පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ ඊට සමාන ආයතනයකින් පළමු උපාධිය සහ ඉහත සුදුසුකම ලබා ගැනීමෙන් පසු අවම වශයෙන් වසර පහක (05) පළපුරුද්දක් පරිසරය සම්බන්ධ ක්ෂේත්‍රයක තිබිය යුතුය.

(ආ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ ඊට සමාන ආයතනයකින් ඕනෑම විෂයයක ප්‍රථම උපාධියක් සහ පරිසරයට අදාළ ක්ෂේත්‍රයක පශ්චාත් උපාධියක් සහ ඉහත සුදුසුකම ලබා ගැනීමෙන් පසු පරිසරය හා සම්බන්ධ ක්ෂේත්‍රයක අවම වශයෙන් වසර තුනක (03) පළපුරුද්දක් තිබිය යුතුය.

(ඇ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ ඊට සමාන ආයතනයකින් පරිසරයට අදාළ ක්ෂේත්‍රයක පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් සමගින් ඕනෑම විෂයයක ප්‍රථම උපාධියක් සහ ඉහත සුදුසුකම ලබා ගැනීමෙන් පසු පරිසරයට අදාළ ක්ෂේත්‍රයක අවම වශයෙන් වස හතරක (04) පළපුරුද්දක් තිබිය යුතුය.

(ඈ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ ආයතනයකින් සමාන අධ්‍යයන අන්තර්ගතයන් සහිත ප්‍රථම උපාධියක් හෝ වෘත්තීය සුදුසුකමක් සහ ඉහත සුදුසුකම ලබා ගැනීමෙන් පසු පරිසරය සම්බන්ධ ක්ෂේත්‍රයක අවම වශයෙන් වසර දහයක (10) පළපුරුද්දක් තිබිය යුතුය.

(ඉ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ ඊට සමාන ආයතනයකින් පරිසර ක්ෂේත්‍රයක පශ්චාත් උපාධි උපාධියක් සහ ඉහත සුදුසුකම ලබා ගැනීමෙන් පසු අවම වශයෙන් වසර පහක (05) පළපුරුද්දක් පරිසරය සම්බන්ධ ක්ෂේත්‍රයක තිබිය යුතුය.

(ඊ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ ඊට සමාන ආයතනයකින් පරිසර ක්ෂේත්‍රයක පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් සහ ඉහත සුදුසුකම් ලබා ගැනීමෙන් පසු අවම වශයෙන් වසර හතක (07) පළපුරුද්දක් පරිසරය සම්බන්ධ ක්ෂේත්‍රයක තිබිය යුතුය.

**(4) ඇමුණුම බී 1 හි 2.3 වැනි ඡේදය අවලංගු කිරීම සහ පහත සඳහන් දේ ආදේශ කිරීම මගින්;**

(අ) ජීව විද්‍යාව, භෞතික විද්‍යාව, භූගෝල විද්‍යාව, කෘෂිකර්මය, ඉංජිනේරු විද්‍යාව, ගොඩනගන ලද පරිසරය, පරිසර කළමනාකරණය හෝ වෙනත් අදාළ විෂයයන් පිළිබඳ පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ ඊට සමාන ආයතනයකින් පළමු උපාධියක් තිබිය යුතුය.

(ආ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ ඊට සමාන ආයතනයකින් ඕනෑම විෂයයක ප්‍රථම උපාධියක් සහ පරිසරයට අදාළ ක්ෂේත්‍රයක පශ්චාත් උපාධියක් තිබිය යුතුය.

(ඇ) පරිසරයට අදාළ ක්ෂේත්‍රයක පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් සමග පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ ඊට සමාන ආයතනයකින් ඕනෑම විෂයයක් පිළිබඳ පළමු උපාධියක් තිබිය යුතුය.

(ඈ) පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ ඊට සමාන ආයතනයකින් සමාන අධ්‍යයන අන්තර්ගතයක් සහිත පළමු උපාධියක් හෝ වෘත්තීය සුදුසුකමක් සහ ඉහත සුදුසුකම ලබා ගැනීමෙන් පසු අවම වශයෙන් වසර පහක (05) පළපුරුද්දක් පරිසරය සම්බන්ධ ක්ෂේත්‍රයක තිබිය යුතුය.

(ඉ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ ඊට සමාන ආයතනයකින් පරිසර ක්ෂේත්‍රයක පශ්චාත් උපාධියක් සහ ඉහත සුදුසුකම ලබා ගැනීමෙන් පසු පරිසරය සම්බන්ධ ක්ෂේත්‍රයක වසර පහකට (05) අඩු පළපුරුද්දක් තිබිය යුතුය.

(ඊ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ ඊට සමාන ආයතනයකින් පරිසර ක්ෂේත්‍රයක පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් සහ ඉහත සුදුසුකම ලබා ගැනීමෙන් පසු අවම වශයෙන් වසර පහක (05) පළපුරුද්දක් පරිසරය සම්බන්ධ ක්ෂේත්‍රයක තිබිය යුතුය.

EOG 08-0113

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.